# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2218/51 - 2021 මාර්තු මස 09 වැනි අඟහරුවාදා - 2021.03.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත**

3 වැනි වගන්තිය යටතේ නියෝගය

2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) උපවගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් 2019 දෙසැම්බර් මස 05 දිනැති අංක 2152/32 දරන ගැසට් නිවේදනයෙහි 2 වැනි ඡේදයේ (උ) උපඡේදය පහත පරිදි සංශෝධනය කොට ආදේශ කරමි.

"(උ) 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට ඇතුළත් වූ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 50 කට නොඅඩු අදියර වශයෙන් වන ප්‍රාග්ධන ආයෝජනයන් සහිත වූ යම් ව්‍යවසායක් විසින් වාණිජ කේන්ද්‍රස්ථාන නියෝග සහ 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අනුමත වූ ව්‍යාපෘති හැර, අදියර වශයෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක හෝ ඉදිකිරීම් කරන කාලසීමාව තුළ සහ වාණිජ කටයුතු ආරම්භ කිරීමට පෙර එකී ව්‍යවසායෙහි යම් ව්‍යාපෘතියක් සඳහා ව්‍යාපෘතියට අදාළ වූ ප්‍රාග්ධන භාණ්ඩ"

මෙම නියෝගය 2021 මාර්තු මස 09 වැනි දින සිට බලපැවැත්වේ.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 මාර්තු මස 09 වන දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

03 - 740


1A - PG 5346 — 475 (2021/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*